# KE 3 - Fundamentals of Law

## යෝජිත පිළිතුරු සහ පිළිතුරු පත්‍ර ලකුණු කිරීමේ මාර්ගෝපදේශනය

# 1 කොටස

## 1(a) කොටස

1.1 නිවැරදි පිළිතුර : ආ

1987 අංක 3 දරන පොදු ගිවිසුම් පිළිබඳ පනතේ විධි විධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවට පවරා ඇත.

| ඉගෙනුම් ඵලය |
|---|
| 1.4.1 පහත සඳහන් ආයතනවල නියාමන කාර්යභාරය පැහැදිලි කිරීමඃ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය,ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය,සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව,කොළඹ කොටස් වෙළඳපොළ , ආයෝජන මණ්ඩලය,සමාගම් රෙජිස්ට්‍රාර්වරයාගේ දෙපාර්තමේන්තුව,ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව,ශ්‍රී ලංකා මහ බැංකුව (විනිමය පාලන දෙපාර්තමේන්තුව)<br><br>1.4.2 ඉහත සඳහන් එක් එක් ආයතනයන්හි ප්‍රධාන කාර්යයන් හඳුනාගැනීම. |

1.2 නිවැරදි පිළිතුර : ආ

මුදල් විශුද්ධිකරණය යනු හිමිකරුවාගේ මූලාශ්‍රයේ සත්‍ය අනන්‍යතාව සැඟවීමේ අරමුණින් සාපරාධී ලෙස රැස්කරන ලද අරමුදල්වල සංචලනයයි.

| ඉගෙනුම් ඵලය |
|---|
| 7.1.1 වංචාව , සොරකම , මුදල් විශුද්ධිකරණය , අල්ලස් , නොසැලකිලිමත්බව සහ ඒවාට ඇති ප්‍රධාන විත්තිවාචික නිර්වචනය කිරීම. |

1.3 නිවැරදි පිළිතුර : ඇ

චෙක්පත් රේඛනය කරන්නේ එහි මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීමෙනි.

| ඉගෙනුම් ඵලය |
|---|
| 4.1.1 චෙක්පත් , විනිමය බිල්පත් හා පොරොන්දු නෝට්ටු නිර්වචනය කර ඒවා අතර ඇති වෙනස හඳුනා ගැනීම.<br><br>4.1.2 ව්‍යාපාර පරිචය තුළ චෙක්පතක , විනිමය බිල්පතක හා පොරොන්දු නෝට්ටුවක කාර්යභාරය පැහැදිලි කිරීම.<br><br>4.2.1 පහත සඳහන් කරුණු පිළිබඳව චෙක්පත් වලට අදාළ නීතිය සහ එහි වාණිජ වටිනාකම් පැහැදිලි කරන්න. සහ (පිටසන් කිරීම,රේඛනය ,අගරුවීම හා බැංකුකරුගේ වගකීම) පැහැදිලි කිරීම.<br><br>4.3.1 විනිමය බිල්පතක් සම්බන්ධයෙන් ' යථාකාල ධාරකයා ' සහ ' ඉදිරිපත් කිරීම ' යන කරුණු වල අර්ථ නිරූපනය සහ වාණිජ වැදගත්කම නිර්වචනය කර පැහැදිලි කිරීම. |

**1.4** නිවැරදි පිළිතුර : අ

චෙක්පත් යනු ඉල්ලූවිට ගෙවිය යුතු බැංකු කරුවෙකුට එදිරිව පමණක් නිශ්චිතව ලියන විශේෂ ආකාරයක විනිමය බිලකි.

| **ඉගෙනුම් ඵලය** | |
|---|---|
| 4.1.1 | චෙක්පත් , විනිමය බිල්පත් හා පොරොන්දු නෝට්ටු නිර්වචනය කර ඒවා අතර ඇති වෙනස්කම් හඳුනා ගැනීම. |
| 4.1.2 | ව්‍යාපාර පරිචය තුළ චෙක්පතක , විනිමය බිල්පතක හා පොරොන්දු නෝට්ටුවක කාර්ය භාරය පැහැදිලි කිරීම. |
| 4.2.1 | පහත සඳහන් කරුණු පිළිබඳව චෙක්පත් වලට අදාළ නීතිය සහ එහි වාණිජ වටිනාකම් පැහැදිලි කරන්න. සහ (පිටසන් කිරීම, රේඛනය, අගරුවීම හා බැංකුකරුගේ වගකීම) පැහැදිලි කිරීම. |
| 4.3.1 | විනිමය බිල්පතක් සම්බන්ධයෙන් ' යථාකාල ධාරකයා ' සහ ' ඉදිරිපත් කිරීම ' යන කරුණු වල අර්ථ නිරූපනය සහ වාණිජ වැදගත්කම නිර්වචනය කර පැහැදිලි කිරීම. |

**1.5** නිවැරදි පිළිතුර : අ

භාණ්ඩ මිලදී ගැනීම හෝ විකිණීමට තම ප්‍රධානියා බැඳී සිටින හෝ විකිණීම සඳහා භාණ්ඩ අනුප්‍රේෂණය කරන හෝ භාණ්ඩ ඇපයට තබමින් මුදල් රැස් කිරීමට බලය ඇති පුද්ගලයෙක්ය.

| **ඉගෙනුම් ඵලය** | |
|---|---|
| 5.1.1 | අන්‍යෝන්‍ය එකඟතාවයෙන් , අනුමත කිරීමෙන් , අවශ්‍යතාවය සහ ප්‍රතිබන්ධනයෙන් නියෝජ්‍යත්වය ඇතිවන අවස්ථා පැහැදිලි කිරීම. |

**1.6** නිවැරදි පිළිතුර : ඈ

ගිවිසුමකට එළඹීම සඳහා කරන ඇරයුමක්

| **ඉගෙනුම් ඵලය** | |
|---|---|
| 2.1.1 | වලංගු ගිවිසුමක අවශ්‍යතාවයන් (අර්පණය සහ ප්‍රතිග්‍රහණය, නෛතික සම්බන්ධතා ඇතිකර ගැනීමේ චේතනාව, ප්‍රතිෂ්ඨාව, ශක්‍යතාව සහ ආකෘතිය ) ගිවිසුමක නිර්වචනය, එකඟතාව, ගිවිසගැනීමට ඇති ශක්‍යතාව, ගිවිසුමක ආකෘතිය, සහමතියේ තථ්‍යතාව පැහැදිලි කිරීම. |

**1.7** නිවැරදි පිළිතුර : ඈ

දායක නොවන විශ්‍රාම වැටුප් ක්‍රමයක් යටතේ විශ්‍රාම වැටුපක් හිමි සේවකයින්ට පනත අදාළ නොවෙයි.

| **ඉගෙනුම් ඵලය** |
|---|
| 6.2.1 පාරිතෝෂිකයට ඇති හිමිකාරිත්වය පැහැදිලි කිරීම. |

**1.8** නිවැරදි පිළිතුර : ඇ

ආහාර දීමනා

| **ඉගෙනුම් ඵලය** |
|---|
| 6.1.1 අදාළ ව්‍යතිරේඛ සහිතව අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට කවුරුන් දායක මුදල් ගෙවිය යුතුද යන්න සඳහන් කිරීම. |
| 6.1.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල අතර ඇති වෙනස්කම් හඳුනාගැනීම. |

**1.9** නිවැරදි පිළිතුර : අ

ගිවිසුම ලිඛිතව පැවතිය යුතු ය.

| **ඉගෙනුම් ඵලය** |
|---|
| 2.1.1 වලංගු ගිවිසුමක අවශ්‍යතාවයන් (අර්පණය සහ ප්‍රතිග්‍රහණය , නෛතික සම්බන්ධතා ඇතිකර ගැනීමේ චේතනාව, ප්‍රතිෂ්ඨාව, ශක්‍යතාව සහ ආකෘතිය ) ගිවිසුමක නිර්වචනය, එකඟතාව, ගිවිසගැනීමට ඇති ශක්‍යතාව, ගිවිසුමක ආකෘතිය, සහමතියේ තථ්‍යතාව පැහැදිලි කිරීම. |

**1.10** නිවැරදි පිළිතුර : අ

පවුල් නීතිය හා වාණිජ නීතිය

| **ඉගෙනුම් ඵලය** |
|---|
| 1.1.1 ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ මූලික ප්‍රභේදයන් සහ කාර්යභාරය හඳුනාගැනීම. |

**(එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20)**

## 01 (b) කොටස

### 02 ප්‍රශ්නය

### 2.1 ප්‍රශ්නය

| ඉගෙනුම් ඵලය |
| --- |
| 1.1.1 ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ මූලික ප්‍රභේදයන් සහ කාර්යභාරය හඳුනාගැනීම. |

I. සිරිතක් යනු පෞරාණික , හොඳින් ස්ථාපිත වූ සහ දීර්ඝ හා අඛණ්ඩ කාල පරිච්ඡේදයක් තිස්සේ භුක්ති විඳින ලද්දක් විය යුතුය.

II. එය සාධාරණ වියයුතු අතර නෛතික මූලධර්මවලට විරෙහි නොවිය යුතුය.

III. සිරිතක පිළිගැනීම සම්බන්ධව සැකයක් නොමැති බවට නිශ්චිත වියයුතු අතර , එය භාවිත නොකිරීම මගින් අපලෝපනය නොවිය යුතුය.

**(එක් කරුණකට ලකුණු 1 බැගින් උපරිම කරුණු 2 කට = ලකුණු 02)**

### 2.2 ප්‍රශ්නය

| ඉගෙනුම් ඵලය |
| --- |
| 5.1.1 අන්‍යෝන්‍ය එකඟතාවයෙන් , අනුමත කිරීමෙන් , අවශ්‍යතාවය සහ ප්‍රතිබන්ධනයෙන් නියෝජ්‍යත්වය ඇතිවන අවස්ථා පැහැදිලි කිරීම. |

I. ප්‍රධානියාගේ උපදෙස් ලබාගැනීමට නොහැකි කමක් තිබිය යුතුය.

II. නියෝජිතත්වය ඇතිකිරීම සඳහා නියම සහ නිශ්චිත අවශ්‍යතාවක් තිබිය යුතුය.

III. අදාළ සියලුම පාර්ශව වල බැඳියාවන් ප්‍රකාරව සාධු සිතින් නියෝජිතයා ක්‍රියා කළ යුතුය.

**(එක් කරුණකට ලකුණු 1 බැගින් උපරිම කරුණු 2 කට = ලකුණු 02)**

### 2.3 ප්‍රශ්නය

| ඉගෙනුම් ඵලය |
| --- |
| 5.1.1 අන්‍යෝන්‍ය එකඟතාවයෙන් , අනුමත කිරීමෙන් , අවශ්‍යතාවය සහ ප්‍රතිබන්ධනයෙන් නියෝජ්‍යත්වය ඇතිවන අවස්ථා පැහැදිලි කිරීම. |

I. මෙම ප්‍රධානියා වෙනුවෙන් ගිවිසුම්ගත වීමට නියෝජිතයාට කලින් බලය ලබාදී තිබුනාක් මෙන් ප්‍රධානියාගේ ධාරිතාවයෙන් අපරානුමත කරන්නාද අපරානුමත කිරීම මගින් ගිවිසුමට බැඳී සිටී.

**(ලකුණු 02)**

## 2.4 ප්‍රශ්නය

| ඉගෙනුම් ඵලය |
|---|
| 5.7.2 වලංගු හවුල් ව්‍යාපාරයක් පිහිටුවා ගැනීමට අවශ්‍ය වන කරුණු සඳහන් කිරීම. |

I. පාර්ශව අතර වලංගු ගිවිසුමක් තිබිය යුතුය.
II. හවුල් ව්‍යාපාරය ව්‍යාපාර කටයුත්තකට අදාල විය යුතුය.
III. ව්‍යාපාර කටයුතු කරගෙන යා යුත්තේ ''පුද්ගලයන් පොදුවේ'' ය.
IV. හවුල් ව්‍යාපාරයීය ව්‍යාපාර කටයුත්තක් කරගෙන යා යුත්තේ ලාභ ලැබීමේ චේතනාවෙන්ය.

**(ලකුණු 1/2 බැගින් ලකුණු 2 යි)**

## 2.5 ප්‍රශ්නය

| ඉගෙනුම් ඵලය |
|---|
| 2.1.1 වලංගු ගිවිසුමක අවශ්‍යතාවයන් (අර්පණය සහ ප්‍රතිග්‍රහණය , නෛතික සම්බන්ධතා ඇතිකර ගැනීමේ චේතනාව, ප්‍රතිෂ්ඨාව, ශක්‍යතාව සහ ආකෘතිය ) ගිවිසුමක නිර්වචනය, එකඟතාව, ගිවිසගැනීමට ඇති ශක්‍යතාව, ගිවිසුමක ආකෘතිය, සහමතියේ තථ්‍යතාව පැහැදිලි කිරීම. |

ගිවිසුමකට එළඹීමට කරන ඇරයුමක විෂය ක්ෂේත්‍රයට ගැනෙන අවස්ථා කිහිපයක් පහත පරිදිය.

- වෙළඳ දැන්වීම්
- සාප්පු කවුළුවක භාණ්ඩ ප්‍රදර්ශනය කිරීම.
- සාප්පුවල ස්වයං සේවා කවුළු
- මිල දර්ශනය
- වෙන්දේසි

**(ඕනෑම කරුණු 2 කට ලකුණු 1 බැගින් = ලකුණු 2 යි)**

## 02 කොටස

**03 වන ප්‍රශ්නය**

| ඉගෙනුම් ඵලය |
|---|
| 2.1.1 වලංගු ගිවිසුමක අවශ්‍යතාවයන් (අර්පණය සහ ප්‍රතිග්‍රහණය, නෛතික සම්බන්ධතා ඇතිකර ගැනීමේ චේතනාව, ප්‍රතිෂ්ඨාව, ශක්‍යතාව සහ ආකෘතිය ) ගිවිසුමක නිර්වචනය, එකඟතාව, ගිවිසගැනීමට ඇති ශක්‍යතාව, ගිවිසුමක ආකෘතිය, සහමතියේ තථ්‍යතාව පැහැදිලි කිරීම. |

**(අ). <u>තැපෑලෙන් ප්‍රතිග්‍රහණය කිරීමට අදාල නීතිමය මූලධර්ම</u>**

තැපෑලෙන් ප්‍රතිග්‍රහණයට අදාළ රීතිය වන්නේ , ප්‍රතිග්‍රහණය අර්පණකරු වෙත ළඟා වුවද නොවුවද **(ලකුණු 1/2)** ප්‍රතිග්‍රහණ ලිපිය තැපැල් පෙට්ටියට බහාලූ මොහොතේ දීම එය වලංගු ප්‍රතිග්‍රහණයක් **(ලකුණු 1 )** බවට පත්වන බවය.

මෙම රීතිය අදාළ වීම සඳහා පහත ලක්ෂණ දක්නට තිබිය යුතුය.

– පාර්ශව දෙක එකඟ වූ සන්නිවේදන මාධ්‍ය තැපෑල විය යුතුය.

**(ලකුණු** 1/2)

- පාර්ශව විසින් තැපෑල සාධාරණ සන්නිවේදන මාධ්‍යක් ලෙස සලකනු ලැබිය යුතුය.

**(ලකුණු** 1/2)

- ප්‍රතිග්‍රහණ ලිපිය නිවැරදි ලිපිනයට යොමු කොට හා නිවැරදි වටිනාකමින් යුත් මුද්දර අලවා තිබිය යුතුය.

**(ලකුණු** 1/2)

**(මුළු ලකුණු 3 යි)**

**(ආ). <u>අර්පණයක් අහෝසි කිරීමට අදාළවන නෛතික මූලධර්ම</u>**

- අර්පණ ලාභියා ප්‍රතිග්‍රහණය කිරීමට පෙර අර්පණයක් ඕනෑම වේලාවක අහෝසි කිරීමට හැකිය.

**(ලකුණු** 1)

- එහෙත් අහෝසි කිරීම අර්පණලාභියාට සන්නිවේදනය කළ යුතු **(ලකුණු** 1) අතර එය අර්පණලාභියා වෙත සත්‍යවශයෙන්ම ළඟාවිය යුතුය. **(ලකුණු** 1) අහෝසි කිරීමක් අර්පණලාභියාට සන්නිවේදනය වීමට පෙර බලාත්මක නැත.

**(මුළු ලකුණු 3 යි)**

(ඇ).**වලංගු ගිවිසුමක් ඇති කරගෙන තිබෙනවාද නැද්ද යන වග**

දී ඇති සිද්ධියේදී සුනිල් වලංගු අර්පණයක් කර ඇත. **(ලකුණු 1 යි)**

ඉහත (අ) කොටසේ දී ඇති පිළිතුරෙහි සඳහන් ප්‍රතිග්‍රහණයට අදාල වන නෛතික මූලධර්ම වලට අනුව 2016 ජනවාරි 8 දින රූනී වලංගු ප්‍රතිග්‍රහණයක් කර ඇත.**(ලකුණු 1 යි)**

දුරකථනයෙන් සිදුකළ බැවින් ,අහෝසි කිරීම ජනවාරි 9 දින සුනිල් වහාම රූනීට සන්නිවේදනය කළේය.**(ලකුණු 1/2)**එහෙත් ඒ වන විට අපර්ණය ප්‍රතිග්‍රහණය කරනු ලැබ තිබූ බැවින් , අහෝසි කිරීම වලංගු නොවේ.**(ලකුණු 1/2)**

එබැවින් සුනිල් සහ රූනී වලංගු ගිවිසුමක් ඇතිකරගෙන ඇත. **(ලකුණු 1 යි)**

**(එකතුව ලකුණු 4 යි)**

**(ප්‍රශ්නය සඳහා මුළු ලකුණු = ලකුණු 10 යි)**

04 . **(අ) ප්‍රශ්නය**

| **ඉගෙනුම් ඵලය** |
|---|
| 3.2.1 භාණ්ඩ විකිණීමේ ගිවිසුමකට අනුව ව්‍යංග කොන්දේසි සහ ප්‍රතිඥාභාර හඳුනා ගැනීම. |

I. **ගයානිගේ දෘෂ්ටිකෝණයෙන් :**

දී ඇති කරුණු අනුව, පෙනී යන්නේ ගයානි මිල දී ගත් බාස්මතී සහල් එහි අරමුණ සඳහා යෝග්‍ය නොවූ බවත් **(ලකුණු 1 යි )** විකිණිය හැකි තත්ත්වයෙන් නොතිබුණු බවත්ය.

**(ලකුණු 1 යි)**

මෙහි ප්‍රතිඵලයක් ලෙස , අමල් භාණ්ඩ විකිණුම් ගිවිසුමක ව්‍යංගය තඹැයුමක (implied warranty) කඩ කිරීමක් සිදුකර ඇත.

**(ලකුණු 1 යි)**
**(මුළු ලකුණු 3 යි)**

II. <u>**අමල්ගේ දෘෂ්ටිකෝණයෙන් :**</u>

අමල්, රතු බාස්මතී සහල් මලු 100 ක් මිල දී ගැනීමට පෙර ඒවායේ සාම්පලයක් පරීක්ෂා කොට එහි ප්‍රතිඵලය ගැන තෘප්තිමත් වූ බැවින් මෙම දෝෂය (සහල්වලට පරිප්පු මිශ්‍ර වීම) සාම්පලයක සාධාරණ පරීක්ෂාවකට ලක් කිරීමෙන් සොයාගත නොහැකි එකක් ලෙස නිගමනය කළ හැකිය. **(ලකුණු 1 යි)**

මෙම සිද්ධියට අදාළවන සාම්පලයක් මඟින් ඇතිවන වෙළඳ ගිවිසුමක ඇතුළත් ව්‍යංගය කොන්දේසි වනු ඇත්තේ:

- තොගය සාම්පලයේ ගුණාත්මක භාවයට අනුරූප විය යුතු **(ලකුණු 1 යි )** අතර
- භාණ්ඩවල දෝෂය (සහල් වලට පරිප්පු මිශ්‍ර වී තිබීම) සාම්පලය සාධාරණ පරීක්ෂාවකට ලක් කිරීමෙන් සොයාගත නොහැකිව තිබූ එකකි. **(ලකුණු 1 යි)**

**(මුළු ලකුණු 03 යි)**
**('අ' කොටස සඳහා මුළු ලකුණු 6 යි)**

04. (ආ) **ප්‍රශ්නය**

| **ඉගෙනුම් ඵලය** |
|---|
| 3.4.1 විකුණුම්කරුට සහ ගැනුම්කරුට ඇති පිළියම් සහ ' මිල නොගෙවූ විකුණුම්කරුගේ '' අයිතිවාසිකම් පැහැදිළි කිරීම. |

දී ඇති සිද්ධියට අදාලව භාණ්ඩ විකිණීම පිළිබඳ ආඥා පනත යටතේ ගයානි සහ අමල් යන දෙදෙනාටම ලබා ගත හැකි ප්‍රතිකර්ම පහත දැක් වේ.

පහත කරුණු සම්බන්ධයෙන් අමල්ට විරුද්ධව අධිකරණමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට ගයානිට අයිතිවාසිකමක් ඇත. **(ලකුණු 1/2 යි)**

- හානි වන්දි සඳහා **(ලකුණු 1/2)**
- විකුණුම් ගිවිසුමේ නිශ්චිත ඉටු කිරීම සඳහා **(ලකුණු 1/2)**
- සහල් මලු සඳහා ගෙවන ලද මිල ආපසු අයකර ගැනීම සඳහා **(ලකුණු 1/2)**

පහත කරුණු සම්බන්ධයෙන් කමල්ට විරුද්ධව අධිකරණමය ක්‍රියාමාර්ගයක් ආරම්භ කිරීමට අමල්ට අයිතිවාසිකමක් ඇත.**(ලකුණු 1/2 යි)**

- ගයානිගේ හිමිකම් පෑමේ ප්‍රතිඵලයක් ලෙස අමල්ට අමල් දරන පිරිවැය අයකර ගැනීමට **(ලකුණු 1/2 යි)**
- සාම්පලයක් මඟින් විකිණීමට අදාළව, භාණ්ඩ විකිණීමක ව්‍යංගය කොන්දේසි කඩ කිරීම වෙනුවෙන් හානි වන්දි ලබා ගැනීම සඳහා **(ලකුණු 1/2 යි)**
- විකිණුම් ගිවිසුම නිශ්චිතව ඉටු කිරීම සඳහා **(ලකුණු 1/2 යි)**

**(ආ) කොටස සඳහා මුළු ලකුණු** 4

**(4 ප්‍රශ්නයට ලබා දෙන ලකුණුවල එකතුව** 10 **යි)**